**ශීර්ෂය 290 - ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන් දීමේ නිළධාරි දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) මෙම වාර්තාවේ 1.6.2(අ) ,(ආ) හා 1.6.3.(අ) ඡේදවල සඳහන් නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ධීවර ආදායම් ලේඛන එකතු කිරීමේදී මුළු ආදායම් එකතුව රු.58,717,336 ක් ලෙස ගණනය කළද මාසික සාරාංශවල එම එකතුව රු.58,897,336 ක් වූයෙන් රු.180,000 ක වෙනසක් විය. | අනුශාංගික ලේඛණ, දෙපාර්තමේන්තු පොත් සමඟ සසඳා වෙනසට හේතු හඳුනාගෙන නිවැරදිව ආදායම ගිණුම්ගත කළ යුතුය. | මෙවැනි අඩුපාඩු මඟ හරවා ගනිමින් නිවැරදි ලෙස දෙපාර්තමේන්තු ආදායම් ලේඛන පවත්වාගෙන යන ලෙසට නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මාසික ගිණුම් සාරාංශ අනුව දෙපාර්තමේන්තුවේ ආදායම් නොවන වෙනත් ලැබීම්වල එකතුව රු.30,516,619 ක් වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එම මුදල රු.29,287,323 ක් ලෙස රු.1,229,296 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ආදායම ගිණුම්ගත කළ යුතුය. | අඩුපාඩු මගහරවා නිවැරදිව ආදායම් ලේඛන පවත්වාගෙන යන ලෙසට නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණ වල මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.742,365,856 ක් වුවද භාණ්ඩාගාර පොත් අනුව වත්කම් වාර්තාවේ එම වටිනාකම | පසුගිය වර්ෂයේ සිට පැවත එන මෙම වෙනසට හේතු හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | භාණ්ඩාගාර ගිණුම්වල දැක්වෙන අගයන් නිවැරදිය. ACA 6 වාර්තාවේ දැක්වෙන ඇතැම් ඉඩම් හා වාහනවල වටිනාකම් පෙර වර්ෂවල සිට ඉදිරියට ගෙන ආ වටිනාකම්ය. තක්සේරු වටිනාකම් ඇතුළත් කර |

| | | | |
|---|---|---|---|
| | රු.620,871,012 ක් වූයෙන් රු.121,494,844 ක නොසැසඳීමක් නිරූපනය විය. | | දෙපාර්තමේන්තු ලේඛන නිවැරදි කිරීම් මේ වන විට සිදුකරමින් පවතී. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට අස්පෘශ්‍ය වත්කම් වල අගය රු.17,357,532 ක් ලෙස දක්වා තිබුණ ද භාණ්ඩාගාර පොත් අනුව එම අගය රු.3,825,523 ක් වූයෙන් රු.13,532,008 ක වෙනසක් නිරීක්ෂණය විය. | පසුගිය වර්ෂයේ සිට පැවත එන මෙම වෙනසට හේතු හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | ඉදිරිපත් කර ඇති විගණන නිරීක්ෂණයෙහි රු.13,532,009 ක වෙනසින් රු.9,842,805.00 ක් වටිනා වත්කම් මේ වනවිට භාණ්ඩාගාර ගිණුම්වලට ඇතුළත් කර ඇත. ඉතිරි වෙනස වූ රු.3,689,204.00 ක වටිනාකම ආරම්භක ශේෂ ගිණුම්ගත කිරීමේ දී ඇති වූ වෙනසක් වන අතර ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

-----------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>----------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>--------------------------------- |
|---|---|---|---|
| (අ) | **හානි පිළිබඳ ලේඛනය**<br>------------------------ | | |
| | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. | පිළිතුරු සපයා නැත. |
| (ආ) | **ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය**<br>------------------------------ | | |
| | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය ප්‍රකාරව කමිටුවේ ලේකම්වරයා විසින් පැමිණීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මාර්ගෝපදේශය ප්‍රකාරව කමිටුවේ ලේකම්වරයා විසින් පැමිණීමේ ලේඛනයක් පවත්වා ගත යුතුය. | පිළිතුරු සපයා නැත. |

### 1.6.4 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ මුහුදු කුඩැල්ලන් අපනයන බලපත්‍ර ආදායම වශයෙන් මුදල් අංශය වෙත ලැබීම්වල මුළු එකතුව රු.4,595,850 ක් ලෙස සඳහන් වුවද කළමනාකරණ අංශය මඟින් නිකුත් කර තිබුණු බලපත්‍ර වටිනාකම රු.4,365,850 ක් ලෙස සඳහන් වූ බැවින් රු.230,000 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඒ සඳහා සාක්ෂි ඉදිරිපත් නොවිය. | නිවැරදිව ආදායම් වාර්තා පවත්වාගෙන යා යුතුය. | ගිණුම් අංශයේ සත්‍ය ආදායම නිවැරදිය. කළමනාකරණ අංශය නිවැරදිව පොත් පත් පවත්වාගෙන නොයාම මෙම වෙනසට හේතු වී ඇත. |
| (ආ) | ස්වස්ථතා සහතික ආදායම වශයෙන් දෙපාර්තමේන්තුවට ලැබී තිබුණු මුදල රු.10,128,200 ක් වුවත් තත්වපාලන අංශය මඟින් නිකුත්කර තිබුණු බලපත්‍රවල වටිනාකම ලෙස රු.10,409,400 ක් සඳහන් වූ හෙයින් රු.281,200 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඒ සඳහා සාක්ෂි ඉදිරිපත් නොවීය. | ආදායම් ප්‍රභවයන් එකතු කරනු ලබන අංශ විසින් නිවැරදිව ආදායම් වාර්තා පවත්වාගෙන යා යුතුය. | 2018 වසරේ අයවී ඇති බලපත්‍ර 2019 වර්ෂයේ නිකුත් කිරීම නිසා මෙම වෙනස ඇතිවී ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශයේ 2017,2018 හා 2019 වර්ෂ සඳහා හිග ආදායම් පිළිවෙලින් රු.100,000, රු.60,000 හා රු.80,000 ක් වශයෙන් මුළු එකතුව රු.240,000 ක් වශයෙන් පැවති අතර පසුගිය වර්ෂය සඳහා වූ හිඟ ආදායම්වලින් රු.5,000 ක් පමණක් අයකරගෙන තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීම සිදුකළ යුතුය. | එකඟ වෙමි. යාත්‍රාංගන නියමිත දිනට ලියාපදිංචිය සඳහා ඉදිරිපත් නොවීම මීට හේතු වී ඇත. මෙම යාත්‍රාංගන හිමි කරුවන් නැවත දැනුවත් කර ලියාපදිංචිය අලුත් කිරීමට කටයුතු නොකරන යාත්‍රාංගන අසාධු ලේඛන ගත කිරීමට පියවර ගනිමි. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සියයට 25 සිට සියයට 100 දක්වා ඉතිරිවීම් තිබුණු වැය විෂයයන් 9 ක ශුද්ධ ප්‍රතිපාදනය රු.442,585,000 ක් හා මුළු වියදම රු.71,570,473 ක් වූ අතර ඉතිරිවීම් ප්‍රමාණය රු.371,014,527 ක් විය. මෙම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 84 ක් වී තිබුණි. පිළිතුරු ලිපිය අනුව දෙපාර්තමේන්තුව සමස්ත ඉතිරියේ ප්‍රතිශතය සියයට 72 ක් ලෙස දක්වා ඇතත් විගණනය විසින් පෙන්වා දී ඇති තොරතුරු අනුව වැය විෂයයන් 9 ට අදාලව ඉතිරිය සියයට 84 ක් වේ. | වෙන්කළ ප්‍රතිපාදන උපයෝජනය කිරීම සඳහා සංවර්ධන ව්‍යාපෘති කඩිනම් කළ යුතුය. | දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනය හා සත්‍ය වියදම අතර ඉතිරියේ ප්‍රතිශතය සියයට 72 ක් ද වේ. |
| (ආ) | ප්‍රතිපාදන සියයට 100 ක් ඉතිරි වී තිබුණු අංක 290 – 1 – 1 – 10 – 2202 දරන වැය විෂයය සඳහා අයවැය යෝජනා යටතේ 2019 ජුනි මස රු.මිලියන 300 ක පරිපූරක ප්‍රතිපාදනයක් ද ලබාදී තිබුණු අතර එමගින් බහුවිධ බෝට්ටු සඳහා ගබඩා පහසුකම් සහ ආරක්ෂක ප්‍රමිතින් වැඩිදියුණු කිරීම සඳහා සියයට 50 ක සහනාධාරයක් ලබාදීමට යෝජනා වී තිබුණි. එහෙත් එම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණු අතර ඒ සඳහා හේතු ද ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලබාගන්නා පරිපූරක ප්‍රතිපාදනවලින් අදාල ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. | 2019 අය වැය යෝජනා යටතේ මෙම මුදල වෙන් වී ඇති අතර ප්‍රතිපාදන වෙන් කරන ලද්දේ 2019 ජුනි මාසයේ දීය. මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා කැබිනට් පත්‍රිකාත් ඉදිරිපත් කිරීමට කටයුතු කළ ද පාර්ලිමේන්තුව විසුරුවා හැරීම නිසා ඉදිරිපත් කිරීමට අවස්ථාවක් නොලැබුණි. ඉන්පසුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට තරම් කාලයක් නොමැතිවීම නිසා කාර්යයන් සිදුකිරීමට නොහැකි විය. |

**2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ කලපු සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මත්ස්‍ය නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීමට කලපුවලට ඉස්සන් පැටවුන් මුදාහැරීමේ ව්‍යාපෘතිය යටතේ යාපනය කලපුවට ඉස්සන් පැටවුන් 21,470,000 ක් මුදාහැරීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් රු.17,176,000 ක් පුද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) යාපනය දිස්ත්‍රික් ධීවර කාර්යාලයට අයත් ගොඩබෑමේ ස්ථාන 13 ක් සඳහා මුදාහැරිය යුතු ස්ථාන පිළිබඳ සැලසුමක් නොතිබුණු අතර ස්ථාන 4 ක් සඳහා දින තුනක හා දින හතරක කාලපරාසයකදී එකම ප්‍රමාණයෙන් දෙවරක් මුදා හැර තිබූ බව නිරීක්ෂණය විය. යාපනය කලපුවට මුදාහල බවට වාර්තා වී ඇති ඉස්සන් පැටවුන් සංඛ්‍යාව වූ 21,470,000 ක ප්‍රමාණයෙන් සියයට 35 ක් වූ 7,445,000 ක ප්‍රමාණයක් **Chullipuram** නැමැති ස්ථානයට මුදාහැර තිබුණ ද ඒ සඳහා විශේෂ හේතුසාධක නිරීක්ෂණය නොවීය. එසේම කිලිනොච්චි දිස්ත්‍රික් ධීවර කාර්යාලයට අයත් ගොඩබෑමේ ස්ථාන 6 ක් තිබුණ ද සැලැසුමක් නොමැතිවීම හේතුවෙන් එම ස්ථානවලට ඉස්සන් පැටවු මුදාහැරීමට කටයුතු කර නොතිබුණි. පිළිතුරු ලිපිය අනුව දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ සහ සියලුම පාර්ශව සමඟ සාකච්ඡා කර විධිමත් සැලැස්මක් ඇතිව එය සිදුකරන ලද බවට දන්වා තිබුණ ද අදාල සැලසුමෙහි පිටපතක් ඉදිරිපත් නොවීය. | සැලසුමක් අනුව අත්‍යවශ්‍ය ස්ථානවලට ඉස්සන් පැටවුන් මුදාහැරීම සිදුකළ යුතු විය. | ඉස්සන් පැටවු තැන්පත් කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු රාශියක් වූ අතර මේ පිළිබඳව දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ සහ සියලුම පාර්ශව සමඟ සාකච්ඡා කර විධිමත් සැලැස්මක් ඇතිව සිදුකරන ලදී. ධීවර පරීක්ෂක කොට්ඨාශයට ආසන්නයේ පවතින හා පහසුවෙන් ප්‍රවේශ විය හැකි තොටුපලවල්වලට දෙවරක් ඉස්සන් පැටවුන් මුදා හරින ලදී.<br>තොටුපල විධිමත් ප්‍රවේශ මාර්ග සහිත වීම නිසා එම තොටුපලට ඉස්සන් පැටවුන් ප්‍රවාහනය කරන ලදී. **Chullipuram** ධීවර පරීක්ෂක කොට්ඨාශයට අයත් තොටුපලවල් 9 ක් සෘජුවම කලපුව සමඟ සම්බන්ධ වන අතර ඉස්සන් පැටවුන් මුදාහැරීමට යොදාගත් ප්‍රමාණයෙන් සියයට 35 ක් **Chullipuram** ධීවර පරීක්ෂක කොට්ඨාශයේ තොටුපලවලට මුදාහරින ලදී. |

| | | | |
|---|---|---|---|
| | | | කිළිනොච්චි දිස්ත්‍රික්කයට අයත් තොටුපලවල්වලට ද ඉස්සන් පැටවුන් මුදා හැරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. |
| (ii) | ඉස්සන් පැටවුන් තැන්පත් කිරීමට පෙර හා තැන්පත් කර මාස 4 ත් 5 ත් අතර කාලයකින් පසු ඉස්සන් නිෂ්පාදන ප්‍රමාණය සැසඳිය යුතු වේ. එහෙත් යාපනය කලපුවේ **Koddady, Navanthurai, Arialai East,** හා **Thampaddy** යන ස්ථානවලට ඉස්සන් පැටවුන් 1,275,000 ක් බැගින් තැන්පත් කර තිබුණ ද වැයකළ රු.4,080,000 ක මුදලට සාපේක්ෂව ඉස්සන් නිෂ්පාදනයේ සැලකිය යුතු වැඩිවීමක් සිදුවී තිබේද යන්න පිළිබඳ පසුවිපරම් සිදු කර නොතිබුණි. | වැය කළ මුදලට සාපේක්ෂව ඉස්සන් නිෂ්පාදන ප්‍රමාණයේ වැඩිවීම පිළිබඳ පසුවිපරම් කටයුතු සිදුකළ යුතු වීම. | කලපුව තුල මෙන්ම මුදුදේ දී ද ඉස්සන් අස්වැන්න ලබාගැනීම සිදුවන බැවින් කලපු තොටුපලවල් කේන්ද්‍ර කරගනිමින් නිෂ්පාදන දත්ත ලබාගැනීම පමණක් ප්‍රමාණවත් නොවන අතර මුහුදේ ද මෙම ඉස්සන් අස්වැන්න ධීවරයින් ලබාගන්නා හෙයින් මුහුදු දත්ත ද මේ සඳහා ලබාගත යුතුවේ. |
| (iii) | පුත්තලම දිස්ත්‍රික් ධීවර කාර්යාලයට අයත් මුන්දලම කලපුවේ රු.1,040,000 ක් වටිනා ඉස්සන් පැටවුන් ලක්ෂ 13 ක් 2018 නොවැම්බර් 24 දින තැන්පත් කර තිබුණ ද 2019 වර්ෂය සඳහා ඉස්සන් අස්වැන්න පිළිබඳ මාසික වාර්තා කිසිවක් දෙපාර්තමේන්තුව විසින් ලබා ගෙන නොතිබූ හෙයින් එහි කාර්යසාධනය මැනීමට නොහැකි විය. පිළිතුරු ලිපිය අනුව මාසික වාර්තා එවා ඇති බව සඳහන් වුවද එම වාර්තා 2018 වර්ෂයට අදාල ඒවා විය. | කාලපරිච්ඡේදවලට අදාලව ඉස්සන් අස්වැන්න පිළිබඳ වාර්තා ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | මුන්දලම කලපුවේ ඉස්සන් අස්වැන්න පිළිබඳ මාසික වාර්තා එවා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මීගමුව**,** පුත්තලම හා මඩකලපුව යන දිස්ත්‍රික් ධීවර කාර්යාලවල ප්‍රතිලාභීන් 186 ක් වෙනුවෙන් මොදා මත්ස්‍ය වගාව සඳහා කූඩු 1116 ක් සෑදීමට අවශ්‍ය භාණ්ඩ සැපයීමටත්**,** ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මඟින් මොදා මත්ස්‍ය පැටවුන් 186,000 ක් මිලදීගෙන සැපයීමටත් සැලසුම් කර තිබුණි. 2018 වර්ෂය අවසන් වනවිට මොදා කූඩු සෑදීමට අවශ්‍ය භාණ්ඩ සපයා අවසන් කර තිබුණු අතර ඒ සඳහා 2019 වර්ෂයේ දී රු.24,986,514ක් ගෙවීම්කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | අයිතම තුනක් සඳහා ගෙවූ මිල හා ඇස්තමේන්තු කළ මිල සැසඳීමේ දී සියයට 65 ත් 77 ත් අතර විශාල පරාසයක වෙනස්කම් අනාවරණය වූයෙන් පිරිවැය ඇස්තමේන්තුව සැකසීමේ දී ඉතා ඉහළ මිලගණන් යොදා ගනිමින් ඇස්තමේන්තු පිරිවැය පිළියෙල කර තිබීම විගණනයේ දී මතභේදයට තුඩු දෙන කරුණක් විය. | තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | පිළිතුරු සපයා නැත. |
| (ii) | කූඩු 1116 ක් සෑදීමට අවශ්‍ය 1 ½ " **PVC** බට ප්‍රමාණය 11160 ක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන මණ්ඩලය මඟින් අනුමත කර තිබිය දී බට 13392 ක ප්‍රමාණයක් සඳහා මිල ගණන් කැඳවා තිබුණි. ඒ අනුව **PVC** බට 2232 ක් වැඩියෙන් මිලදී ගැනීම වෙනුවෙන් රු. 868,248 ක් ගෙවා තිබුණි. | ප්‍රසම්පාදන මණ්ඩල අනුමැතිය මත ලංසු ලේඛන පිළියෙල කළ යුතු වේ. | පිළිතුරු සපයා නැත. |
| (iii) | මොදා කූඩු සෑදීමට අවශ්‍ය මිලදී ගැනීම් සඳහා ඉදිරිපත් වූ ලංසු 4 න් ලංසු 3 ක් අයිතම සියල්ලටම මිලගණන් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ලංසු ප්‍රතික්ෂේප කර නැවත මිල ගණන් කැඳවා අයිතම සිල්ලටම මිලගණන් ඉදිරිපත් කළ ලංසුකරුව තෝරාගෙන තිබුණි. එහෙත් ඇස්තමේන්තු මිලට වඩා අධික මිලක් ඉදිරිපත්ව තිබිය දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.2(අ), 7.12.2(ආ) සහ 7.12.3 (අ) මාර්ගෝපදේශ අනුව කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කර රජයට වඩාත් වාසිදායක තීරණ ගත යුතු වේ. | පිළිතුරු සපයා නැත. |

| | | | |
|---|---|---|---|
| (iv) | මඩකලපුව දිස්ත්‍රික් ධීවර කාර්යාලයේ මොදා කූඩු සෑදීම සඳහා ද්‍රව්‍ය හා උපකරණ ඉල්ලුම් කර තිබූ ප්‍රතිලාභීන් 06 දෙනෙකු විසින් එක් අයෙකුට කූඩු 06 බැගින් වූ භාණ්ඩ භාරගෙන නොතිබුණු හෙයින් මොදා කූඩු 36 ක් සඳහා මිලදීගත් රු.700,884 ක ද්‍රව්‍යවල වටිනාකම නිෂ්ඵල වියදමක් වී තිබුණි. | නිසි අධ්‍යයනයකින් ප්‍රතිලාභීන් තෝරාගත යුතු වේ. | පිළිතුරු සපයා නැත. |
| (v) | ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියෙන් දිස්ත්‍රික් ධීවර කාර්යාල 3 ක ප්‍රතිලාභීන් වෙත ලබාදී තිබුණු මොදා මත්ස්‍ය පැටවුන් කුඩා බැවින් සියයට 80 ක් පමණ කූඩුවලින් ඉවත්ව ගොස් ඇති බවත්, පැටවුන් 5 ත් 10 ත් අතර ප්‍රමාණයක් මියයාමත්, බැග්වලින් ඉවත්කළ පසු සෑහෙන ප්‍රමාණයක් මියයාමත්, පිළිවිතර අනුව පැටවුන් අඟල් 2.5 විය යුතු වුවත් සැපයූ පැටවුන් සෙ.මී.2 ක් පමණ වීමත් යන දෝෂයන් පැවති බව නිරීක්ෂණය විය. තවද සැපයිය යුතු 186,000ක පැටවුන්ගෙන් පැටවුන් 46,500 ක් පමණක් සපයා තිබුණු හෙයින් නියමිත පැටවුන් ප්‍රමාණය සැපයීමට ද අපොහොසත්වී තිබුණි. මේ අනුව රු.මිලියන 25 කට ආසන්න වියදමක් දැරීම තුලින් අපේක්ෂිත ඉලක්ක ලභාකර ගැනීමට නොහැකි වී තිබූ අතර මේ සම්බන්ධව වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමක් ද සිදුකර නොතිබුණි. | අපේක්ෂිත ඉලක්ක ලභාකර ගැනීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත. |
| (vi) | මොදා මසුන් අස්වැන්න පිළිබඳ වාර්තා අදාල දිස්ත්‍රික් කාර්යාලවලින් ලැබී නොතිබුණු නිසා මොදා මත්ස්‍ය අස්වැන්න පිළිබඳව පසුවිපරම් කටයුතු සිදුකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | අපේක්ෂිත ඉලක්ක අත්පත් කරගෙන ඇති බවට පසුවිපරම් කටයුතු සිදුකළ යුතුය. | පිළිතුරු සපයා නැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කලපු සංවර්ධන වැඩසටහන යටතේ වූ කලපු සීමා සලකුණු කිරීමේ ව්‍යාපෘතිය මඟින් 2018 වර්ෂයේ කලපු 10 ක සංරක්ෂණය වෙනුවෙන් භෞතික සීමා සලකුණු කිරීමට මායිම් කණු 19,888 ක් රු.මිලියන 31.9 කට සැපයීමට සැලසුම් කර තිබුණ ද සපයා තිබූ කණු ප්‍රමාණය 14,748 ක් වූ අතර ගෙවා තිබුණු මුදල රු.21,339,345 ක් විය. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | මෙම ප්‍රසම්පාදනයේ දී ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1, 4.3 හා 8.9.1 මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය. | පිළිතුරු සපයා නැත. |
| (ii) | කලපු 10 වෙනුවෙන් සැපයිය යුතු මායිම් කණු 19,888 අතුරින් කලපු 02 ක් සඳහා මායිම් කණු 1,705 ක් සම්පූර්ණයෙන්ම සපයා නොතිබුණු අතර කලපු 06 ක් සඳහා සපයා නොතිබුණු මායිම් කණු ප්‍රමාණයේ වටිනාකම රු.9,141,748 ක් විය. | කොන්ත්‍රාත්කරු නියමිත සැපයීම් නොකරන්නේනම් කාර්යසාධනය සුරක්ෂණය දෙපාර්තමේන්තුවට පවරා ගැනීම කළ යුතුය. | පිළිතුරු සපයා නැත. |
| (iii) | අනුමැතියක් රහිතව වැඩිපුර කණු 2,276 ක් පුත්තලම කලපුව සඳහා මිලදීගෙන තිබූ අතර මේ සඳහා රු.3,826,638 ක් වැයකර තිබුණි. | මුදල් ගෙවීමට පෙර වැඩ අනුමත වී ඇත් ද යන්න හා සැලසුමට අනුකූල ද යන්න පරීක්ෂාකර ගෙවීම් කළ යුතුය. | පිළිතුරු සපයා නැත. |
| (iv) | කලපු සීමා සලකුණු කිරීමේ කාර්යය සඳහා 2019 වර්ෂයට රු.මිලියන 25 ක් වෙන්කර තිබුණ ද රු.මිලියන 14 ක් පමණක් වැයකර තිබූ බැවින් රු.මිලියන 11 ක අරමුදල් ඌන උපයෝජනය වී තිබූ බව නිරීක්ෂණය විය. කණු සැපයිය යුතු නිවැරදි ස්ථානවලට සපයා නොතිබීමත් ප්‍රමිතියට අනුකූලව කණු සපයා නොතිබීමත් කණු සිටුවීමේ කොන්ත්‍රාත්තුවේ ප්‍රසම්පාදනය ප්‍රමාදවීමත් යනාදී කරුණුවල බලපෑම හේතුවෙන් 2019 වර්ෂය අවසන් වන විටත් කලපු සීමා සලකුණු කිරීම ප්‍රමාද වී තිබුණි. | අපේක්ෂිත ඉලක්ක ළඟා කරගැනීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 ක්‍රියාකාරි සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ එක් එක් ව්‍යාපෘතිවලට අදාලව මූල්‍ය ප්‍රගතිය පමණක් ඉදිරිපත් කර තිබුණු නමුත්, එම ව්‍යාපෘතිවලට අදාලව භෞතික ප්‍රගතිය ප්‍රතිශතාත්මකව ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කාර්යසාධනය සම්බන්ධ වාර්තා නිවැරදිව පිළියෙල කළ යුතුය. | පිළිතුරු සපයා නැත. |
| (ආ) | 2019 ක්‍රියාකාරි සැලැස්මෙහි නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම යටතේ 2019 වර්ෂය සඳහා රු.මිලියන 38.7 ක් වෙන්කර තිබුණ ද 2018 වර්ෂයේ ආරම්භකළ **VMS** ගොඩනැගිල්ලෙහි ඉතිරි වැඩ කටයුතු සඳහා හා බිල්පත් පියවීම සඳහා එම ප්‍රතිපාදන යොදවා තිබුණි. මේ අනුව සැලසුම් තාත්ත්විකව පිළියෙල කිරීමක් නිරීක්ෂණය නොවීය. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම වර්ෂයේ ක්‍රියාකාරකම් සඳහා තාත්විකව පිළියෙල කළ යුතුය. | පිළිතුරු සපයා නැත. |

### 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | යාපනය තලයාඩි නවාතැන ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකරන බව ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා තිබුණද ඒ සඳහා ප්‍රතිපාදන කිසිවක් වැයකර නොතිබුණි. ප්‍රතිසංස්කරණ කටයුතු සියල්ල 2019 වර්ෂයේ නොවැම්බර් මස වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණු නමුත් 2019 දෙසැම්බර් 31 දිනවන විටත් සම්පූර්ණ කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ප්‍රතිසංස්කරණ සිදුකිරීමේ අවශ්‍යතාව මත ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර ඇති බැවින් එම කාර්යයන් ප්‍රමාදයකින් තොරව ඉටුකළ යුතුය. | පිළිතුරු සපයා නැත. |
| (ආ) | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන කාර්යාල කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා වටිනාකම රු.මිලියන 54 ක් වූ මෘදුකාංග | අවශ්‍ය කාර්යයන් කොන්ත්‍රාත් කාලය තුල කාර්යක්ෂමව ඉටුකරවා ගැනීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත. |

පද්ධතියක් හඳුන්වාදීමේ ව්‍යාපෘතිය 2018 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර 2019 අවසාන වන විට නිමකළ යුතුව තිබුණි. ඒ සඳහා රු.මිලියන 23.09 ක ප්‍රතිපාදන ලබාදී තිබුණ ද 2019 වර්ෂය අවසාන වන විටත් එම කාර්යය සම්පූර්ණ කර නොතිබූ අතර ඒ වන විට රු.මිලියන 13.7 ක් ගෙවා තිබුණි.

## 3.3 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 නොවැම්බර් සිට 2019 දෙසැම්බර් කාල සීමාව තුල ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ 6 වන මහලෙහි පිහිටි දෙපාර්තමේන්තු පරිශ්‍රයට වැසි ජලය කාන්දුවීම හේතුවෙන් කාර්යාල උපකරණවලට රු.13,666,960 ක තක්සේරු වටිනාකමකින් යුතු හානි සිදුවී තිබුණ ද ඒ පිළිබඳ වගකිව යුතු නිලධාරීන් සොයා පසු විපරම් කටයුතු සිදුකර නොතිබූ අතර මුදල් රෙගුලාසි 103(1)(ඉ) ප්‍රකාරව එය හානි හා පාඩු ලේඛනයේ ලේඛනගත කර ද නොතිබූ බව නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 103(1)(ඉ) ප්‍රකාරව පාඩු හා හානි සම්බන්ධයෙන් අදාල වටිනාකම් එම ලේඛනයෙහි සටහන් කළ යුතුවීම. | පිළිතුරු සපයා නැත. |

## 3.4 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තයේ යෙදෙන බහුදින ධීවර යාත්‍රාවල පහසුකම් වැඩි දියුණු කිරීමට අදාල උපකරණ/ කට්ටල සැපයීමේ සහනාධාර ක්‍රමයක් හෝ එය ක්‍රියාත්මක කෙරෙන ක්‍රමවේදයක් ඇතුලත් යෝජනා නිර්දේශයක් හෝ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් හෝ නොමැතිව 2019 වර්ෂයේ දී ධීවර ප්‍රජාවට සහනාධාර යටතේ මරුවැල් පන්න කට්ටල 37 ක් හා වින්ච් උපකරණ 21 ක් සැපයීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් රු.50,536,520 ක් ගෙවා තිබුණි. | නිවැරදිව අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. | පිළිතුරු සපයා නැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මරුවැල් පන්න කට්ටල සැපයීම සඳහා සුදුසු ප්‍රතිලාභීන් තෝරාගැනීමට කමිටුවක් පත් කිරීමට අධ්‍යක්ෂ (කර්මාන්ත) විසින් නිලධාරීන් නම්කර තිබුණ ද කමිටුවක් මඟින් ප්‍රතිලාභීන් තෝරාගෙන තිබුණු බව සනාථ කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. | ප්‍රතිලාභීන් තෝරා ගැනීම විධිමත් විය යුතු ය. | පිළිතුරු සපයා නැත. |